දිස්පැන්සරිය

මේකට වරකාගොඩ දිස්පැන්සරේ අලුතෙන් ඇතිල්ල ඉන්න දොක්ටර මහත්තයාගෙන් බේත් පොඩ්ඩක් අරං දීපන් පුංචිනෝනක්කෙ. ඔන්න මං කිව්වට බලහං බේත් දෙවේල බොනකොට පොඩිඒකා නැගිටින් නැද්දැ කියල." මා අසනිපයෙන් ඉස්තෝප්පුවේ හාන්සි පුටුවේ වකුටු වී සිටින විට පහළ ජයසේනලාගේ අම්මා, ජෝර්ජි ආච්චි මගේ ඔළුවට අත තියා බලා බඩට තට්ටුකොට කීවා ය.

"අනේ ජෝජිනෝනො දැන් මන් දන්න බේත් ඔක්කොම හදල දුන්න බං. ඒත් ඇහැක්කටක් අරිත් නෑ. වතුර පොදක් බොන් නෑ. මොනව හරි පොඩ්ඩක් උගුරෙන් පහළට ගියොත් දෙපැත්තෙන් ම යනව. පත්තියං වෙන් නෑ. "

"ඒක තමයි, මං කීවට උඹ අදම අරන් පලයං වරකගොඩට. තවත් බලබලා ඉන් නැතුව." ජෝර්ජි ආච්චි ඉහළට ගත් දෙ බැම පහළට දමාගෙන, අනේ තිබුණු පන්මල්ල දෙකට නවා කිහිල්ලේ ගසාගෙන උඩහකඩේ පැත්තට ගියා ය.

"මෙන්න අන්දරේ ආවා" වරකාගොඩ පැත්තේ පදිංචි ව සිටි වයසක පුද්ගලයෙක් සතියකට දින දෙකතුනක් අපේ ගෙවල් පැත්තේ ද පැමිණ මුදල් සහ නොයෙකුත් දේ ලබා ගනියි. ඔලොගුවක් කරේ ය. වම් අතේ හැර මිටිය යි. දකුණු අතේ ඒ කාලයේ තිබුණු ගිස් සිගරට් ටිං එකක් ය. ඉස්තෝප්පුවේ ඇඳේ බිත්තිය පැත්තට හැරී නිදා සිටි ආනා, ඔහුගේ කට හඬට පාර පැත්තට හැරී බැලුවේ ය.

"ඇහුනද, මෙන්න මේ මනුස්සයට මොනවහරි දීපල්ල. අන්දරේ ඇවිල්ල." ආනා ආච්චිට ඇහෙන්නට කීවේ ය.

අපේ ගෙදර තිබෙන හාල් මනින හුණ්ඩුවෙන් බාගයක් පමණ හාල් පුරවාගෙන පැමිණි ආච්චි හාල් ටික අන්දරේ ගේ ඔලොගුවට දැම්මා ය. හැඹිලිය ඉණෙන් ගෙන එහි අඩිය අතගා බලා සත දෙකේ කාසියක් සොයාගෙන අන්දරේගේ ටිංඑකට දමන විට ටිං හඬ නැගුණි.

"හැබෑට අන්දරේ අද වරකගොඩ දිස්පැන්සරේ බේත් දෙනවද?" අන්දරේ වරකාගොඩ පැත්තේ සිට පැමිණෙන බව දන්නා ආච්චි ඇසුවා ය.
"හ්මි හ්" යනුවෙන් ඔළුව වනා පවසමින් අන්දරේ ආපසු හැරී පාරට පියඹන සෙමෙන් සෙමෙන් ප්‍රේමතිලක බාප්පලාගේ නිවස පැත්තට ගමන් කළේ ය.
"ඇහුනද, දැන් මං ගියානං හොඳයි පොඩිඒකාට බේත් ටිකක් ගේන්න." යනුවෙන් ආනාට ඇහෙන්නට පැවසූ ආච්චි කඩිමුඩියේ ලකලෑස්ති විය. ඇඳගෙන හිටපු චීත්ත රෙද්දට උඩින් කම්බායක් ඇඳගත් ඇය සුදු පාට බෝර්චිච් අත් දාපු හැට්ටයක් ඇඳගත්තා ය. මට ද ජංගියක් අන්දාගෙන තවත් ජංගියක් මල්ලට දමාගත්තා ය. බේත් ගේන්න බෝතලයක් සහ තේ දමා ගත් බෝතලයක් ද මල්ලට දමා සුදු පාට සාළුව කරට දමා ගෙන මල්ලේ අඩු අතරින් අත යවා බෑගය වැලමිටට ගෙන දෑතින් ම මා ඔසවා වඩා ගත්තා ය.
දැන් ආච්චි වරකාගොඩ පැත්තට ඉක්මන් ගමනින් අඩිය තබයි. මා එතරම් ම පුංචි අයකු නොවන නිසා මගේ කකුල් දෙක ආච්චිගේ දණිස් වලිනුත් පහළට එල්ලෙයි.

මග දී හමුවන හැම අයෙකුගේ ම ප්‍රශ්ණය එකක් ය. එයට දෙන උත්තරය ද එකක් ය. මානාන පනු කරන තුරු හමුවන හැම කෙනාම " මොකෝ බේත් ගේන්නවත් යනවද්ද" යි අසන පැනයට "ඔව් බේත් ගේන්න වරකගොට්ට යනව." යන පිළිතුර ආච්චිගෙන් කියැවෙයි.

ආච්චිට අමාරුවන විට මා බිමින් තබා අතින් අල්ලා ගන්නත් මට පයින් යාමට බැරි ය. එසේ බැරිබැරියා-වට මා කරන්නේ එතන ම වාඩිවෙන එක ය.
"මොකෝ රත්තරන් පුතේ, වරෙන් වරෙන් මැණික අතට" ආච්චිගේ මහන්සි අමාරුවට වඩා ගිත හයිය ය.
දහපොළක පමණ මා බිම තබා විනාඩියක විතර මහන්සි ඇර යළි කරපින්නා ගනිමින් ගොස් ආච්චි ඩිස්පැන්සරියට ගොඩ වී මා බිමින් තබා හති අරින්නට වූවා ය.

ඩිස්පැන්සරියේ දෙතුන් දෙනෙකුට වඩා නැත. ඉක්මනින් ම දොස්තර මහතා ළඟට යාමට හැකි විය.
"නම?"
"පියසේන"
"වයස?"
"හතරයි"
"මොකක්ද අමාරුව?"
"අනේ මහත්තයෝ දැන් දවස් තුනක ඉඳන් මොකුත් කන්නෑ. බඩ ඩෝලෙ වගේ පුරෝදාල. ඇහැක්කටක් අරින්නෑ. මොනා හරි පොඩ්ඩක් උගුරෙන් පහළට

නිර්මාණකරුවකුගේ මතක සටහන්



සනත් පියසේන

ගියොත් දෙපැත්තෙන්ම යනව. අපිරණයක් කියල හිතල නොදීපු බේතක් නෑ. අර හරොන්සිංඝෙදාට කියල දෙහිත් මතුරෝල දුන්න. මිරිස් හොදිත් මැසිරෙව්ව. කෝ මොහොකටවත් අහන් නෑ. අර පහළ ජෝජිනෝන කීවෙ ඔය මහත්තැන්ට පෙන්නන්න කියල. "ආච්චි බොහෝ ම බැගෑපත් ව විස්තර කියාගෙන කියාගෙන යනවිට දොස්තර මහතා ඇහුම්කන් දෙමින් නළල රැළි ගන්වමින් දත් නො පෙන්වා සිනාසෙමින් බලා සිටියේ ය.

"දිව...?" දොස්තර මහතා කියයි.
"දිව දික්කරපන් පුතේ" ඒ ආච්චිය.
මා දිව දිගුකළ විට දොස්තර මහතා කෑලි තුනේ ලොකු විදුලි පන්දමක් එළියකර කට තුළ එහෙට මෙහෙට හරව හරවා බැලුවේ ය. ඇස් දෙක ඇඟිල්ලෙන් උඩට ඔසවා බලයි. පපුවට නළාව තබා බලයි. බඩට තට්ටුකර බලයි. මුහුණ ටිකක් වෙනස්කර ගත් දොස්තර මහතා පැවසුවේ ළමයාට අමාරු බවත්, ඉස්පිරිතාලෙක තවත්තන්නට සිදුවෙන බවත් ය.

ආච්චි හඬන්නට පටන් ගත්තා ය. ආච්චිට හැඹිලියේ තිබුණු මුදල් ගණන ගැන සිහි වන්නට ඇත. කැන්දකඩුවට මා ද

සයිමන් ආනා අපේ ගෙය අසල කාරෙක නවත්වා අපට බැසීමට සැලැස්විය. සාක්කුවට අත දමා රුපියලේ කොළයක් ගත් ඔහු '' ඉඳා නංගියෙ මේක අරගනින්. පොඩිඒකාට හෝලිස් එකක් අරන් දීපන් '' යයි කියමින් ආච්චිගේ අතේ තබා කාරෙක පහළට යාමට සලස්වා පහළ කඩේ හරියේදී එන්පිම සැර දමා පදවාගෙන ගියේ ය.

ඔසවාගෙන පයින් යන්නටත් බැරි ය. ලමිස්සියන් හතර දෙනෙක් ගෙදර ය. උන්ව තනියෙන් තියන්නත් බැරි ය. ඒ හැම එකටමත් වැඩිය මුනුපුරාගේ ජීවිතය ගැන බය ය.
"කාගෙද ළමය?"
"ලොකු දූගෙ"
"කෝ අම්ම?"
"පුතා ඉන්නේ අපේ ගෙදර මහත්තයෝ"

දොස්තර මහතාට අනුකම්පා හිතෙන්නට ඇත. දයාව කරුණාව උතුරන්නට ඇත. " මං කියන විදියට පරද්දන්න නැතිව බේත් ටික හරියට ම දෙන්න පුළුවන් ද?"

"හොඳමයි බුදු මහත්තයෝ "

සනත් පියසේන

1949 ජනවාරි 14 වන දින කළුතර දිස්ත්‍රික්කයේ වරකාගොඩ ඉහළ කරන්නාගොඩ ග්‍රාමයේදී උපත ලද සනත් පියසේන මහතා 1964 දී ගීතාංජලි කවි පුවත්පතට පද්‍ය රචනා සපයමින් කවියට අවතීර්ණ විය. බොහෝ පුවත්පත් සඟරා හා ගුවන් විදුලියට කවි සැපයූ ඔහු 1973 වර්ෂයේදී ගිම මල් සහ ගිනි පුපුරු, පද්‍ය සංග්‍රහයේ සම සංස්කාරක වශයෙන් ග්‍රන්ථකරණයට පිවිසෙමින් 1993 වර්ෂයේදී ,ලොකු නංගි පොඩි නංගි, 1996 දී ,සෙනෙහස ඕනෑකර තිබේ, 1999 දී ,එසි එකට විසිවෙමි, නම් පද්‍ය සංග්‍රහයන් පල කළේ ය. වරකාගොඩ වෙරළුගස් තොටුපලේ ගඟ දියමත පැවැත්වුනු ඓතිහාසික වෙසක් දන්සලක් පාදකකොට ලියවුණු ,පාවෙන දන්සල, ළමා කෘතියේද කතුවරයා වන ඔහු ,සැපඳ දුකඳ මහළු වයස, නම් සංචාද කවිපොතේ සම්පා දකයාද වේ. ,අපි පිළියන්දල, සහ ,දරුමිණ, පුවත්පත්හි සංස්කාරකයා වූ ඔහු 1996 දී සෙනෙහස ඕනෑකර තිබේ පද්‍ය සංග්‍රහය වෙනුවෙන් සමස්ත ලංකා දෙවන ස්ථානය ලබාගත් අතර සම්මාන සහතික රැසක් ලබාගෙන ඇත. 2006 වර්ෂයේදී ,අස්ටි මස් - මි කායේ කේසා, නම් වූ පද්‍ය සංග්‍රහයදල ,ළපටි වියේ මතක අලලා, ,පොඩි කොලුවයි ගමයි ගඟයි, විත්ති රසකතා සංග්‍රහයද ලියා පළ කොට ඇත. ගුවන්විදුලි මාධ්‍යයේ බාහිර ශිල්පියෙකු වශයෙන්ද කටයුතු කර ඇති සනත් පියසේන මහතා මාධ්‍ය කලා කීර්ති - කාව්‍ය කලාශූරි ගෞරව නාමයෙන්ද පුද ලද අතර සමස්ත ලංකා සාම විනිසුරුවරයෙකුද වේ. රංගන ශිල්පියෙකු වශයෙන් නාට්‍ය හා ටෙලිනාට්‍ය රාශියක චරිත නිරූපනය කොට ඇති ඔහුට මෑතකදී පිළියන්දල නගර සභාව මගින් ගෞරව සම්මානයක් ද ප්‍රදානය කර ඇත.

"හැබැයි වරද්දන්න වෙනස්කරන්න එපා තේරුනා ද?"
ආච්චි තරමක සහනකාරී බවකින්, එහෙත් වගකීමෙන් යුතු බවක් මුහුණෙන් පෙන්වා දෙකට නැවී ඔළුව වැනුවා ය.
"මෙන්න මේ කුඩුමුළු දැන් පොවන්න ඕනෑ"
දොස්තර මහතා පොඩි වතුර කෝප්පයක් සමග කුඩුමුළුක් ආච්චි අත තැබුවේ ය.

කුඩුමුළු කටට හලා වතුර උගුරක් පෙවී සැනෙන් බඩ පපුව දෙතුන් පාරක් ගැස්සී වමනය දෝරේ ගියේ ය. දොස්තර මහතා පස්සට පැන්නත් බේරෙන්නට නො හැකි විය. අසල තිබුණු වේවැල් කූඩයක් පයින් ඇද මා දෙසට තල්ලු කළ දොස්තර මහතාගේ මුහුණ දෙස මම බයින් හොරැහින් බැලුවෙමි.
වමනය අවසන් වනතුරු බලා සිටි දොස්තර මහතා ඇතුළු කාමරයට නොයි ආපසු පැමිණියේ ඉංජෙක්ෂන් බටයක ඉඳිකටුව උඩට හරවාගෙන ඒ දෙස බලා සපත්තු අඩිය උඩින්උඩින් තබමිනි.

"මගෙ අම්මෝ"යි ගිරිය යටින් කෑ ගැසූ මම අත් දෙක බංකුව උඩට තබා වෙර ගෙන උඩට පැන නැවත බිමට පැන දුවන්නට වුණෙමි. පාරට පැන නෑබොඩ පැත්තට දිව්වෙමි. දිස්පැන්සරිය දෙස මෙන් ම පිටුපස ද බලමින් දිව්වෙමි. දොස්තර මහතා මිදුලේ සිට පහළ පාරේ සිටි යමෙකුට මා අල්ලන ලෙස සංඥා දෙනු ඒ අතර ම දුටුවෙමි. ආච්චි පාරට බැස නොන්ඩි ගසමින් ද ඉක්මන් ගමනින් මා පසු පස කෑ ගසමින් එනවා පිටුපස බලන මට පෙනේ.

පාරේ සිටි අයෙක් මා පසුපස එළවන්නට විය. ඉදිරියට පැමිණෙමින් සිටි එක් අයෙක් මගේ දිව්මම හරස් කොට මා වැරෙන් නවතා ඔසවා ගත්තේ ය. මම දෑත දෙපය විසි කරමින් ඇඹරෙමින් කෑගැසුවෙමි. වැරෙන් අල්ලාගෙන සිටි ඔහුගෙන් ගැලවෙන්නට බැරි තැන ඔහුගේ ඇඟට කෙළ ගැසුවෙමි. එහෙත් ඔහු මා අත නොහැර, ඔසවා ගෙනවිත් දොස්තර මහතා ළඟින් තබා තදකොට අල්ලාගෙන සිටියේ වීරයකු වගේ ය. දැන් දෙතුන් දෙනෙ-ක් මා වටේ සිට තැනින් තැනින් තදකොට අල්ලාගෙන සිටිති. මගේ බෙරිහන්දීම මැද පුළුන් කැබැල්ල අතේ අතුල්ලා ඉඳිකටු තුඩ ශරීරයට ගිල්වනු මට දැනිණි. ඉඳිකටුව ආපසු ඇද්ද විට මගේ ඇඩිල්ලත් නැවතුණි.

"ඕකටනෙ මේ මැරෙන්න හැදුවෙ" කෙනෙක් පවසයි.

"ඇඳේ නැගිටින්න බැරුව හිටපු එකා. අඩියක් පයින් එන්න බැරුව බිම වාඩි වුණ එකා දුවපු දිවිල්ලක්. මූට මේච්චර කොහෙන් පණාක් ආවද දෙයියනෙ. දෙන්න හිතෙනව පු... පුපුරන්න. " පවසමින් මා දෙස ඔරවා ගෙන පැමිණි ආච්චි දොස්තර මහතා දෙසට ඔළුව පාත්කර අහිංසක ව හිනාවුණේ සමාව අයදින්නාක් මෙනි.

" කමක් නෑ කමක් නෑ. මේ පෙති බාගයක් රෑට දෙන්න ඕනෑ. පැය දෙකෙන් දෙකට කුඩු මුළෙන් බාගෙ ගානෙ දෙන්න ඕනෑ. දවසට තුන් වෙලක් කෑමෙන් ඉස්සෙල්ල බේත් වතුර හොඳේ. කෑඳ වතුර අරුළුපිටි දුන්නට කමක් නෑ. හොඳට බලාගන්නෝනෙ." කියමින් දොස්තර මහතා ඉතිරි බේත් ටික ආච්චි අතට දුන්නේ ය.

"මහත්තය බුදුන් දැක නිවන් දකින්නෝනෙ" කියමින් ආච්චි දොස්තර මහතාට දෙකට නැවී ගරුකොට නැවත මා වඩාගෙන දිස්පැන්සරියෙන් පිට වූවා ය. ටික දුරක් එන විට මට බඩඑළිය යන්නට එන බවක් දැනී කෙඳිරිගාමින් බිමට රිටුවෙමි. බිමට බට විට ම වතුර ගලන්නාක් මෙන් ගලන්නට විය. පිටිපතුල් දෙක සකස් කොට මට වාඩි වීමට සලස්වා අය එම කාර්යයට පහසු ලෙස ඉඩකඩ සකස් කර දුන්නා ය.

ජරාවුණු ජංගිය අසල තිබුණු බෝක්කු වළකින් තරමක් සෝදා මාවද සෝදා මල්ලේ තිබුණු ජංගිය අන්දවා නැවත මා වඩා ගත්තාය. ටික දුරක් එන විට සයිමන් ආනාගේ කළුපාට කාරෙක අප අසල නැවැත්විය.
''පොඩිඒකාට මොකද නංගියෙ. වරෙල්ල යන්න'' සයිමන් ආනා කවුළුවෙන් හිස එළියට දමා පැවසුවේ ය.

''මේ පොඩිපුතාට බේත් ටිකක් ගන්න කියල දිස්පැන්සරේට ගියා''
''වරෙල්ල යන්න'' කියමින් සයිමන් ආනා ඉස්සරහ දොර ඇර සීට් එක නවා කාරයට නගින්නට ඉඩ සකසා දුන්නේ ය.

'' අයිය යන්න, පොඩිඒකා ජරාකරගෙන. ඕකෙ නගින්න බෑ. අපි පයින්ම එන්නං'' ආච්චි අදිමදි කරමින් කීවාය.
''මෙන්න මෙහෙ නැගපන් යෝදියෙ. ඕක හෝදගන්න බැරියැ''
සයිමන් ආනාගේ ගෝරනාඩුවෙන් බියපත් ආච්චි මාවද ඇඳගෙන කාරයට නැංගාය. මා ඉස්සරහ ෂීට්එකේ වාඩි වීමට හැදුවත් ආච්චි බලෙන් ම ඇයගේ උකුළට ගත්තේ කාරෙක් ෂීට්වල ජරාව ගෙවේය යි බියෙනි.

සයිමන් ආනා අපේ ගෙය අසල කාරෙක නවත්වා අපට බැසීමට සැලැස්විය. සාක්කුවට අත දමා රුපියලේ කොළයක් ගත් ඔහු '' ඉඳා නංගියෙ මේක අරගනින්. පොඩිඒකාට හෝලිස් එකක් අරන් දීපන් '' යයි කියමින් ආච්චිගේ අතේ තබා කාරෙක පහළට යාමට සලස්වා පහළ කඩේ හරියේදී එන්පිම සැර දමා පදවාගෙන ගියේ ය.
"අයියට බුදුබව අත්වෙයි. " ආච්චි දෑතින්ම රුපියල අතට මිරිකා ගත්තාය.

පසුදා එළිවෙනතුරු මා ආච්චිගේ කකුල් දෙක උඩ නිදාගෙන ඇත. ආච්චි පැය දෙකෙන් දෙකට කුඩුමුළෙන් බාගය බැගින් දෙමින් එළි වනතුරු නිදිමරා ඇත. එළිවෙන කොට ආච්චිගේ ඇඟ දිගේත් වටපණුවෝ බුරුතු පිටින් දිව්වේ ලු.

දවසකින් දෙකකින් මගේ අසනීපය සුව වූවත් අම්මා වෙලාව බලවාගෙන ඇවිත්, මාගේ කේන්දරේ බොහෝ ගිරහ අපල තිබෙන බවත්, ඒකට ගිරහපූජාවක් තියා නවනාතෙ බැඳිය යුතු බවත් දයිරත්න උන්තෙගේ පැවසූ වග ආච්චිට පවසා දෙනෙතේ බේරුණු කඳුළු අත්තලයෙන් පිස දා ගත්තා ය.